අංගුත්තර නිකාය

චතුක්ක නිපාතෝ

4.1.5.9. විපල්ලාස සුත්තං

චත්තාරෝ’මේ භික්ඛවේ, සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා. කතමේ චත්තාරෝ?

මහණෙනි, මේ විපරීත සංඥාවෝ, චිත්ත විපරීතයෝ, දෘෂ්ටි විපරීතයෝ සතරකි. ඒ කවර සතරක් ද යත්;

අනිච්චේ භික්ඛවේ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ. දුක්ඛේ භික්ඛවේ සුඛන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ. අනත්තනි භික්ඛවේ අත්තාති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ. අසුභේ භික්ඛවේ සුභන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ. ඉමේ ඛෝ භික්ඛවේ චත්තාරෝ සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා.

1. මහණෙනි, අනිත්‍ය දේ පිළිබඳ ව නිත්‍ය යයි දකියි ද, මෙය විපරීත සංඥාවකි. විපරීත සිතකි. විපරීත දෘෂ්ටියකි.

2. මහණෙනි, දුක් වූ දේ පිළිබඳ ව සැප යයි දකියි ද, මෙය විපරීත සංඥාවකි. විපරීත සිතකි. විපරීත දෘෂ්ටියකි.

3. මහණෙනි, අනාත්ම වූ දේ පිළිබඳ ව ආත්ම යයි දකියි ද, මෙය විපරීත සංඥාවකි. විපරීත සිතකි. විපරීත දෘෂ්ටියකි.

4. මහණෙනි, අසුභ දේ පිළිබඳ ව සුභ යයි දකියි ද, මෙය විපරීත සංඥාවකි. විපරීත සිතකි. විපරීත දෘෂ්ටියකි.

මහණෙනි, මේ වනාහී විපරීත සංඥාවෝ, චිත්ත විපරීතයෝ, දෘෂ්ටි විපරීතයෝ සතරයි.

චත්තාරෝ’මේ භික්ඛවේ න සඤ්ඤාවිපල්ලාසා න චිත්තවිපල්ලාසා න දිට්ඨිවිපල්ලාසා. කතමේ චත්තාරෝ?

මහණෙනි, මේ විපරීත සංඥා නොවන, චිත්ත විපරීතයක් නොවන, දෘෂ්ටි විපරීතයක් නොවන කරුණු සතරකි. ඒ කවර සතරක් ද යත්;

අනිච්චේ භික්ඛවේ අනිච්චන්ති න සඤ්ඤාවිපල්ලාසෝ න චිත්තවිපල්ලාසෝ න දිට්ඨිවිපල්ලාසෝ. දුක්ඛේ භික්ඛවේ දුක්ඛන්ති න සඤ්ඤාවිපල්ලාසෝ න චිත්තවිපල්ලාසෝ න දිට්ඨිවිපල්ලාසෝ. අනත්තනි භික්ඛවේ අනත්තාති න සඤ්ඤාවිපල්ලාසෝ න චිත්තවිපල්ලාසෝ න දිට්ඨිවිපල්ලාසෝ. අසුභේ භික්ඛවේ අසුභන්ති න සඤ්ඤාවිපල්ලාසෝ න චිත්තවිපල්ලාසෝ න දිට්ඨිවිපල්ලාසෝ.

1. මහණෙනි, අනිත්‍ය දේ පිළිබඳ ව අනිත්‍ය වශයෙන් දකියි ද, මෙය අවිපරීත සංඥාවකි. අවිපරීත සිතකි. අවිපරීත දෘෂ්ටියකි.

2. මහණෙනි, දුක් වූ දේ පිළිබඳ ව දුක වශයෙන් දකියි ද, මෙය අවිපරීත සංඥාවකි. අවිපරීත සිතකි. අවිපරීත දෘෂ්ටියකි.

3. මහණෙනි, අනාත්ම වූ දේ පිළිබඳ ව අනාත්ම වශයෙන් දකියි ද, මෙය අවිපරීත සංඥාවකි. අවිපරීත සිතකි. අවිපරීත දෘෂ්ටියකි.

4. මහණෙනි, අසුභ දේ පිළිබඳ ව අසුභ වශයෙන් දකියි ද, මෙය අවිපරීත සංඥාවකි. අවිපරීත සිතකි. අවිපරීත දෘෂ්ටියකි.

ඉමේ ඛෝ භික්ඛවේ චත්තාරෝ න සඤ්ඤාවිපල්ලාසා න චිත්තවිපල්ලාසා න දිට්ඨිවිපල්ලාසාති.

මහණෙනි, මේ වනාහී විපරීත සංඥා නොවන, චිත්ත විපරීතයක් නොවන, දෘෂ්ටි විපරීතයක් නොවන කරුණු සතරයි.

(ගාථා)

අනිච්චේ නිච්චසඤ්ඤිනෝ දුක්ඛේ ච සුඛසඤ්ඤිනෝ,

අනත්තනි ච අත්තාති අසුභේ සුභසඤ්ඤිනෝ

1. අනිත්‍ය දේ පිළිබඳ ව නිත්‍ය සංඥාවෙන් යුතු, දුක් දේ පිළිබඳ ව සැප සංඥාවෙන් යුතු, අනාත්ම දේ පිළිබඳ ව ආත්ම සංඥාවෙන් යුතු, අසුභ දේ පිළිබඳ ව සුභ සංඥාවෙන් යුතු,

මිච්ඡාදිට්ඨිගතා සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනෝ,

තේ යෝගයුත්තා මාරස්ස අයෝගක්ඛෙමිනෝ ජනා

2. වැරදි ලෙස දෘෂ්ටිගත වූ සත්වයෝ සැලෙන සිතින් යුතුව, විපරීත සිතින් යුතුව සිටිති. ඒ කෙලෙස් යෝගයන්ගෙන් නිදහස් ව ලබන බිය රහිත බව නොලැබූ ඔවුහු මාරයාගේ ක්ලේශ යෝගයෙහි යෙදුණාහු වෙති.

සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනෝ,

යදා ච බුද්ධා ලෝකස්මිං උප්පජ්ජන්ති පභංකරා

3. මෙසේ සත්වයෝ ඉපදෙන මැරෙන සසරේ සැරිසරා යති. යම් කලෙක අඳුරු ලොව එළිය කරන බුදුවරයෝ ලෝකයෙහි පහළ වෙත් ද,

තේමං ධම්මං පකාසෙන්ති දුක්ඛූපසමගාමිනං,

තේසං සුත්වාන සප්පඤ්ඤා සචිත්තං පච්චලද්ධ තේ

4. ඒ බුදුවරු දුක් සංසිඳවන්නා වූ මේ චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රකාශ කරති. ප්‍රඥාව ඇති සත්වයෝ ඒ බුදුවරුන්ගේ ධර්මය අසා තම සිතට අවබෝධය ලබා,

අනිච්චං අනිච්චතෝ දක්ඛුං දුක්ඛමද්දක්ඛු දුක්ඛතෝ,

අනත්තනි අනත්තාති අසුභං අසුභතද්දසුං,

සම්මාදිට්ඨිසමාදානා සබ්බං දුක්ඛං උපච්චගුන්ති

5. එකල්හී ඔවුහු අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් දුටහ. දුක් දෙය දුක් වශයෙන් දුටහ. අනාත්ම දෙය අනාත්ම වශයෙන් දුටහ. අසුභ දෙය අසුභ වශයෙන් දුටහ. මෙසේ නිවැරදි දෘෂ්ටියක් සමාදන් වීම හේතුවෙන් සියළු සසර දුක් ඉක්මවා ගියහ.

සාදු! සාදු!! සාදු!!!

විපල්ලාස සූත්‍රය නිමා විය.